# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.25 පැය 1535 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/837 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**උතුරු පළාත් පරිගණක අපරාධ විමර්ශන උප ඒකකයක් ආරම්භ කිරීම - යාපනය පොලිස් ස්ථානය**

සමාජ මාධ්‍ය අපරාධ හා පරිගණක අපරාධ විමර්ශන කඩිනම් කිරීම හා ඒ තුළින් මහජනතාවට කඩිනමින් අවශ්‍ය සේවවක් සැපයීමේ අරමුණින් පරිගණක අපරාධ විමර්ශණ උප ඒකක පළාත් මට්ටමින් ස්ථාපිත කිරීමේ වැඩ සටහනක් ගරු වැඩබලන පොලිස්පති තුමාගේ උපදෙස් අනුව ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව, උතුරු පළාතේ මහජනතාව වෙනුවෙන් යාපනය පොලිස් ස්ථානය තුළ පරිගණක අපරාධ විමර්ශණ උප ඒකකයක් විවෘත කිරීම 2025.04.25 වන අද දින ගරු වැඩබලන පොලිස්පති තුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකිරීමට කටයුතු සූදානම් කර ඇත.

මෙම උතුරු පළාත් උප ඒකකය මඟින් පහත කාර්යයන් ඉටු කිරීමට අපේක්ෂිතය

- සමාජ මාධ්‍ය ඔස්සේ සිදු වන ලිංගික හිරිහැර සම්බන්ධ විමර්ශන
- සමාජ මාධ්‍ය හරහා සිදුවන මුදල් වංචාවන් සම්බන්ධ විමර්ශන
- පරිඝණක අපරාධ පනත යටතේ ගැනෙන වරදවල් සම්බන්ධ විමර්ශණ
- සමාජ මාධ්‍ය හරහා සිදු කරනු ලබන ප්‍රශ්නගත පල කිරීම් සහ ව්‍යාජ මුහුණු පොත් ගිණුම් ඉවත් කිරීම සහ අනවරස ප්‍රවේශය ලබා ගත් ගිණුම් නැවත ලබා ගැනීම
- ප්‍රාදේශීය පොලිස් ස්ථාන වෙත විමර්ශන සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම

මෙම වැඩපිළිවෙල යටතේ මේ වන විට දැනට දකුණු පළාත, මධ්‍යම පළාත, වයඹ පළාත, උතුරු මැද පළාත හා නැගෙනහිර යන පළාත් ආවරණය වන පරිදි පරිගණක අපරාධ විමර්ශණ උප ඒකක ආරම්භ කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**